**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**Police Media Division**


තැ.පෙ. අංකය / த.பெ.இ / P.O. Box No — 517

ෆැක්ස් / தொலை நகல் / Fax — 011-2329500

දුරකථනය / தொலைபேசி / Telephone — 011-2384024, 011-2395605

වෙබ් ලිපිනය / இணைய தளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E mail — dir.media@police.lk


මගේ අංකය / எனது இல / My No — D/MEDIA/OUT/282/22

ඔබේ අංකය / உமது இல / Your No —

දිනය / திகதி / Date — 2022.02.18 පැය 2200

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**බුද්ධි අංශය පිළිබඳව සමාජ මාධ්‍යයේ සංසරණය වන සාවද්‍ය පුවතක් සම්බන්ධව**

කල්මුණේ පොලිස් වසමේදී ශ්‍රී ලංකා තමිල් අරුසු කච්චි පක්ෂයේ තරුණ සංවිධානයේ සහකාර ලේකම් නිදන්ෂන් යන අයව සුදු වෑන් රථයකින් පැමිණි බුද්ධි අංශයේ පිරිසක් විසින් පැහැර ගැනීමට උත්සාහ කළ බවට Shanakiyan Rajaputhiran Rasama… නමින් පුද්ගලයෙකුගේ ඡායාරූපයක් සහිතව තිබෙන ට්විටර් ගිණුමක තොරතුරක් පලකර තිබෙන අතර එම පුවත වෙනත් සමාජ මාධ්‍ය ජාලා තුළද සංසරණය වී තිබී ඇත.

ඒ අනුව සමාජ මාධ්‍යයේ සංසරණය වන එම පුවත සම්බන්ධයෙන් කල්මුණ දිස්ත්‍රික් භාර සහකාර පොලිස් අධිකාරි විසින් විමර්ශනයක් ආරම්භ කර අද දින එවන ලද වාර්තාව අනුව, වට්ටවිධාන පාර, කල්මුණ 02 ලිපිනයේ පදිංචි අරුල් ඥාණමූර්ති නිදන්ෂන් යන අය විසින් 2022.02.17 වන දින සවස් කාලයේ පුද්ගලයින් පිරිසක් ඔහුට පහරදීමට තැත් කර තර්ජනය කිරීමක් සම්බන්ධයෙන් කල්මුණ පොලිස් ස්ථානයට පැමිණිල්ලක් සිදු කර ඇති බවට දන්වා ඇත.

එම පැමිණිල්ල අනුව පැමිණිලිකරු සහ එම අවස්ථාවේ වෑන් රථයේ සිටි පුද්ගලයන් දෙදෙනා වෑන් රථයද සමඟ කල්මුණ පොලිස් ස්ථානයට කැඳවා ඇත. වෑන් රථයේ රියදුරු සහ ඉදිරිපස අසුනේ පැමිණි පුද්ගලයා මරදමුන 02 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.

ඔවුන් යතුරුපැදි අමතර කොටස් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන දෙදෙනෙකු බවට අනාවරණය වී ඇත. සිදුවීම පිළිබඳව විමර්ශනය කිරීමේදී 2022.02.17 වන දින පෙරියනිලාවනි ප්‍රදේශයේ අරුල් ඥාණමූර්ති නිදන්ෂන් යන අය යතුරුපැදියකින් ගමන්කරමින් අතුරු මාර්ගයක සිට ප්‍රධාන මාර්ගයට පිවිසීමේදී මෙම වෑන් රථය ඉහත දෙදෙනාද සමඟ ප්‍රධාන මාර්ගයේ ධාවනය වී ඇති අතර යතුරුපැදිය සහ වෑන් රථය එකිනෙකට ගැටීමට යාම නිසා ඔවුන් අතර බහින් බස් වීමක් සිදු වී ඇති බව අනාවරණය වී ඇත.

ඒ අනුව පැමිණිලිකරු විසින් කල්මුණේ පොලිස් ස්ථානය වෙත තමාට පහරදීමට තැත්කර තර්ජනය කිරීම සම්බන්ධයෙන් මෙම පැමිණිල්ල ඉදිරිපත් කර තිබෙන බව මේ පිලිබඳව සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය විය.

**මේ පිළිබඳව තවදුරටත් සිදුකල විමර්ශනයේදී තහවුරුවී ඇත්තේ මෙම වෑන් රථය එම අවස්ථාවේ එය පදවාගෙන ගිය පුද්ගලයාගේ පියාට අයත් ඔවුන් සතු වෑන් රථයක් බවත්, කිසිදු ආකාරයක බුද්ධි සේවයකට අයත් වෑන් රථයක් නොවන බවත් එහි ගමන්කල පුද්ගලයන් බුද්ධි නිලධාරීන් නොවන බවත් සහ ඔවුන් සාමාන්‍ය ව්‍යාපාරික පුද්ගලයින් බවත්ය. තවද මෙම අවස්ථාවේදී අරුල් නිදන්ෂන් යන අය කිසිදු ආකාරයක පැහැර ගැනීමකට ලක්වී නොමැති බවද වාර්තාකර ඇති අතර බහින්බස් වීම නිසා මෙම පැමිණිල්ල සිදුකර ඇති බවද නිරීක්ෂණය වී ඇත.**

**එම නිසා සුදු වෑන් රථයකින් බුද්ධි අංශයක නිලධරයින් පැමිණ පැමිණිලිකරු පැහැර ගෙන යාමට උත්සාහ කල බවට Shanakiyan Rajaputhiran Rasama… යන නමින් පුද්ගලයෙකුගේ ඡායාරූපයක් සහිතව තිබෙන ට්විටර් ගිණුමේ සහ වෙනත් සමාජ මාධ්‍ය ජාලාවල තිබූ බව සඳහන් තොරතුර සාවද්‍ය සහ ජනතාව නොමග යවන සුළු තොරතුරක් බව මෙතෙක් කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෙම සිදුවීම සහ අසත්‍ය තොරතුරු ප්‍රචාරය වීම සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කල්මුණ දිස්ත්‍රික් භාර සහකාර පොලිස් අධිකාරී වරයා විසින් සිදු කරනු ඇත.**

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**